# ජනශ්‍රැති පිළිබඳ දෙවන පර්යේෂණ සමුළුව

# FLRC - 2017

# පර්යේෂණ සාර සංග්‍රහය

## පෙර ගුණ නුවණ නූතන සහජීවනයට




සංවිධානය

කලා පර්ෂදය සහ සංස්කෘතික මධ්‍යස්ථානය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# පර්යේෂණ සාර සංග්‍රහය

## ජනශ්‍රැති පිළිබඳ දෙවන පර්යේෂණ සමුළුව
## FLRC-2017

"පෙර ගුණ නුවණ නූතන සහජීවනයට"

**2017 දෙසැම්බර් 15**

**කලා පර්ෂදය සහ සංස්කෘතික මධ්‍යස්ථානය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**ගංගොඩවිල, නුගේගොඩ**

# ශ්‍රී ලංකාවේ පතල් කර්මාන්තයේදී භාවිත වන විශ්වාස, වතාවත් හා පිළිවෙත් පිළිබඳ විමර්ශනයක් (රත්නපුර දෝනපතල් ඇසුරින්)

පී. එම්. ජයකුමාර,* එන්. කාන්තිලතා, පී. අබේසුන්දර, සුමනජිත් කුමාර
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
pmjayakumara11@gmail.com

ඉන්දියානු සාගරයේ පිහිටි ඉතා කුඩා දිවයිනක් වූ ශ්‍රී ලංකාව භූමි ප්‍රමාණයෙන් ගත් විට සාපේක්ෂව ස්වාභාවික සුන්දරත්වයක් සහ ස්වාභාවික සම්පත්ද පිරුණු දිවයිනකි. ශ්‍රී ලංකාව නැගෙනහිර සහ බටහිර මුහුදු මාර්ග අතර පිහිටීම හේතුවෙන් ඉතිහාසය පුරාම විවිධ සංස්කෘතික හා දේශපාලන බලපෑම්වලට නිරාවරණය වූ රටකි. මෙරට අතීතයේ සිටම මැණික්, කුළු බඩු, අලි ඇතුන් සහ ස්වාභාවික සෞන්දර්යය පිළිබඳ ප්‍රසිද්ධියක් උසුලයි. විශේෂයෙන් මෙහිදී මැණික් ප්‍රධාන විය. ශ්‍රී ලංකාවේ මැණික් ලබාගැනීම පතල් ආශ්‍රිතව සිදුවන අතර ලංකාවේ පතල් වර්ග හතරක් දැකිය හැකිය. එනම් පතස්, තට්ටු පතල් (දෝනපතල්), ඇදුම් පතල් (ගඟ ඇදීමේ පතල්) හා ජපන් ගෑසීම (කිමිදී ගං පතුලේ ඇති මැණික් ඉල්ලං ගොඩ දැමීම) වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ පතල් කර්මාන්තයේදී භාවිත වන විශ්වාස වතාවත් හා පිළිවෙත් පිළිබඳ අධ්‍යයනය කිරීමයි. මෙම පර්යේෂණය සිදුකරනු ලැබුවේ වඩාත් ජනප්‍රිය පතල් ක්‍රමයක් වන දෝන පතල් ඇසුරිනි. මෙහිදී සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ක්‍රමවේදයන් යොදාගත් අතර අධ්‍යයන ප්‍රදේශය වූයේ රත්නපුරය, පැල්මඩුල්ල, නිවිතිගල, බළංගොඩ, සහ කහවත්ත යන ප්‍රදේශවලින් තෝරාගත් පතල් දහයකිනි. මෙම පතල් කර්මාන්තයේදී ප්‍රධාන ලෙස විශ්වාසයන්, ඇදහිලි හා චාරිත්‍රපිළිවෙත් පවතින බව දැකගත හැකිය. ඒ සඳහා විවිධ හේතු ඇතිබවත් කාලයත් සමග විවිධ චාරිත්‍රපිළිවෙත් වෙනස්වී ඇති බවත් නිරීක්ෂණය කළ හැකි විය. විශේෂයෙන් කාන්තාවන් පතල් අසලට පැමිණීම සිදුවන්නේ නැත. පතල් වළේ කතාකරන කුඩු, කැඳ, චික්, අසුචි, කක්කා, හිගන්නෝ වැනි වදන් භාවිත නොකරයි. පතල අසලට කබරයන් පැමිණීම සහ උරුවම් බෑම අසුබ ලෙස සලකයි. එසේම පතල් කැපීමට පෙර දෙවියන්ට භාරවීම (විශේෂයෙන් සමන් දෙවියන්ට) පතල් කැනීමට පෙර බුදුන් වැඳීම සහ පතලට සහ භූමිය වැඳ නමස්කාර කර පතලට බැසීම උරුමස් අනුභව කොට කිසිවිටෙකත් පතල් නොබැසීම, පතලේ සිව්කොනේ මල් පහන් ද දල්වා මල් පැල තැනීම සුභ වේලාවන්ට අනුව සියලු කටයුතු සිදුකිරීම රාහු කාලය සහ මරු සිටින දිශාව බැලීම වැනි විශ්වාසයන් ඇදහිලි හා චාරිත්‍රපිළිවෙත් පතල් කර්මාන්තය ආශ්‍රිතව පවතී. රාහු කාලයේ ඉල්ලම් කැඩීම සිදු නොකරයි. එසේම ඉල්ලම කැඩීමට පෙර ඉල්ලම් කුර සෝදා එයට වැඳීම සිදු කරයි. පතලේ වැඩ අවසන් වී දිනය නිම වූ පසු නැවත පතලට වැඳීම සිදු කරයි. මෙවැනි විශ්වාස චාරිත්‍රපිළිවෙත් පතල් කර්මාන්තය ආශ්‍රිතව දැකගත හැකිබව නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද: *පතල් කර්මාන්තය, විශ්වාස, වතාවත්, රත්නපුරය*